සැ. යු.- (i) 2010.06.18 දින පළ වූ අංක 1,659 දරන *ගැසට් පත්‍රයේ* I - III කොටස පළ නොවීය.

(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2010 වර්ෂය සඳහා ගාල්ල මහාධිකරණයේ ජූරි සභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය සිංහල භාෂාවෙන් පළ වේ.

(iii) මෙම *ගැසට් පත්‍රයේ* දෙමළ අනුවාදයන් වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,660 - 2010 ජුනි මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2010.06.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 1240 |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1240 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීන් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජූලි මස 02 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජුනි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත් සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට මවිසින් කරන ලද පත් කිරීම්**

| *අනු. අංකය* | *නම/ධුරය* | *පත් කරන ලද ධුරය/අමාත්‍යාංශය ක්‍රියාත්මක වන දිනය* |
|---|---|---|
| 01 | නැගෙනහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික කටයුතු, ඉඩම් සහ ඉඩම් සංවර්ධන හා ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යවර ගරු විමලවීර දිසානායක මැතිතුමා | 2010.06.05 වැනි දින සිට නැගෙනහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මැතිතුමා යලි දිවයිනට පැමිණෙන තුරු එකී අමාත්‍යාංශයේ වැඩබලන ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් පත් කිරීම. |
| 02 | නැගෙනහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික කටයුතු ඉඩම් සහ ඉඩම් සංවර්ධන හා ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යවර ගරු විමලවීර දිසානායක මැතිතුමා | 2010.06.05 වැනි දින සිට නැගෙනහිර පළාතේ, මුදල් හා ක්‍රම ඉඩම් සම්පාදන, නීතිය හා සාමය, පළාත් පරිපාලන, මිනිස් බල, පළාත් පාලන, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම්, ග්‍රාමීය සංවර්ධන, සංචාරක සහ පාරිසරික කටයුතු පිළිබඳ අමාත්‍යවර ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මැතිතුමා යලි දිවයිනට පැමිණෙන තුරු එකී අමාත්‍යාංශයේ වැඩ බලන අමාත්‍යවරයා වශයෙන් පත් කිරීම. |

මොහාන් විජේවික්‍රම,
ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

ත්‍රිකුණාමලය,
ඕර්ස්හිල් පාරේ පිහිටි,
නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

06-531

---

# පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

1993 අංක 3 හා 1995 අංක 7 දරන ප්‍රඥප්ති මගින් සංශෝධිත 1992 අංක 1 දරන බස්නාහිර පළාතේ පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ සාදා ප්‍රසිද්ධ කරනු ලබන විධිවිධාන, රීති, නියෝග නියමයන්, විධිවිධානයන් සහ නියම කිරීම් සංශෝධන

1996 අගෝස්තු මස 19 වැනි සඳුදා අංක 937/05 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වූ බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1995 අංක 1 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා නියෝගවල හතර වැනි උපලේඛනය මෙසේ සංශෝධනය කරනු ලැබේ.

2003 ජනවාරි 24 සිකුරාදා අංක 1273 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වූ එම ලේඛනයේ 6 වැනි විෂයාංගය ද ඇතුළුව අංක 12, 13, 14, 15 යන අළුතින් ඇතුළත් කළ විෂයාංග ද නැවත සංශෝධනය කරනු ලැබේ.

| | | රු. ශත |
|---|---|---|
| 1. | මගී සේවා අවසර පත්‍රයක් සඳහා එක් බස් රථයකට | 5,000.00 |
| 2. | අතුරු මාර්ග බලපත්‍රයක් සඳහා එක් මාර්ගයකට – බස් රථයකට | 2,500.00 |
| 3. | මගී සේවා අවසර පත්‍රයේ අනුපිටපතක් සඳහා (අස්ථානගත වූ අවස්ථාවක) | 2,000.00 |
| 4. | මගී සේවා අවසර පත්‍රයේ සංශෝධනයන් සඳහා | 250.00 |
| 5. | මගී සේවා අවසර පත්‍රයේ වලංගු කාලය අවසන් වන දින හෝ එදිනට පෙර දීර්ඝ කර නොගතහොත් අයකළ යුතු දඩ මුදල සෑම මාසයක් හෝ ඊට පසු කාලයක් සඳහා බලපත්‍ර ගාස්තුවෙන් 10% කි. | |
| 6. | මාසික සේවා ගාස්තුව එක් බස්රථයක් සඳහා (සාමාන්‍ය සේවා) | 1,000.00 |
| 7. | නියමිත දිනට මාසික සේවා ගාස්තුව නොගෙවීම නිසා සේවා ගාස්තුවෙන් 10% කි. (වෙනස්කර නැත) | |
| 8. | මගී සේවා අවසර පත්‍රයේ විස්තර සඳහන් වින්ස්ක්‍රීන් ලේබලය සඳහා | 200.00 |
| 9. | වින්ස්ක්‍රීන් ලේබලය අනුපිටපතක් සඳහා | 200.00 |
| 10. | වින්ස්ක්‍රීන් ලේබලය සංශෝධන | 200.00 |
| 11. | i. විශේෂ කුලී ගමන් බලපත්‍ර සඳහා පළමු දිනට | 300.00 |
| | ii. අතිරේක සෑම දිනයක් සඳහා | 200.00 |
| 12. | මාසික පිවිසුම් ගාස්තුව එක් බස් රථයකට (සාමාන්‍ය සේවා) | 1,000.00 |
| 13. | මාසික පිවිසුම් ගාස්තුව එක් සුඛෝපභෝගී බස් රථයකට | 1,000.00 |
| 14. | මගී සේවා අවසර පත්‍රයක් සඳහා එක් වර්ෂයකට එක් සුඛෝපභෝගී බස් රථයකට | 5,000.00 |
| 15. | මාසික සේවා ගාස්තුව එක් සුඛෝපභෝගී බස්රථයක් සඳහා | 1,000.00 |

මෙම සංශෝධන 2010.07.01 දින සිට බලපැවැත්විය යුතුය.

එච්. එම්. උපාලි කොඩිකාර,
ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික
හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා
බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

2010 ජුනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

06-489

---

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව

### ඌව පළාතේ පළාත් සභාවේ යෝජිත මාර්ග ප්‍රඥප්ති කෙටුම්පත

ඌව පළාතේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් ප්‍රඥප්තියේ කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පළ කරමි:-

මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවීමෙන් දින 10 ක් ඉක්මවා ගිය පසු මෙම කෙටුම්පත අනුමැතිය සඳහා ඌව පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10ක් තුළ දී එකී කරුණු ලිඛිතව පහත ලිපිනයට මා වෙත දැනුම් දිය යුතුය.

අමාත්‍ය ආර්. එම්. කුමාරසිරි රත්නායක,
මාර්ග සංවර්ධන, නිවාස, ජලසම්පාදන, පාරිභෝගික කටයුතු
හා සමුපකාර සහ ආහාර සැපයීම් සහ බෙදාහැරීම් අමාත්‍යාංශය,
ඌව පළාතේ පළාත් සභාව.

2010 ජුනි මස 03 වැනි දින,
අංක 301,
ආර්. එච්. ගුණවර්ධන මාවත,
බදුල්ල.
අමාත්‍ය කාර්යාලයේ දී ය.

**යෝජිත ඌව පළාත් මාර්ග ප්‍රඥප්ති කෙටුම්පත**

***ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ 9 වැනි උප ලේඛනයේ 1 වැනි ලැයිස්තුවේ 6 වැනි වගන්තියේ සඳහන් ප්‍රමාණයට ඌව පළාත ඇතුලත මාර්ග සැලසුම් කිරීම, ඉදිකිරීම, සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය නෛතික ක්‍රියා පිළිවෙලක් ඇති කිරීම සඳහාත්, ඊට ආනුෂංගික වූ කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි***

ඌව පළාත තුළ පිහිටි මාර්ග සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම හා පරිපාලනය කිරීම සහ ඌව පළාත තුළ ඉදිරියේ දී ඉදිකරනු ලබන මාර්ග සැලසුම් කිරීම, ඉදි කිරීම, සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම හා පරිපාලනය කිරීම මගින් ඌව පළාත තුළ යහපත් මාර්ග පද්ධතියක් පවත්වාගෙන යාම තුලින් පළාතේ ජනතාවගේ සමාජ, ආර්ථික සංවර්ධනය ඉහල නැංවීමට ඌව පළාත් සභාව බැඳී සිටින හෙයින් ; පූර්විකාව.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය ''ඌව පළාත් මාර්ග ප්‍රඥප්තිය'' යනුවෙන් හඳුන්වනු ලබන අතර, ඌව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවන දිනය.

## I වැනි කොටස

### සාමාන්‍ය

2. (1) මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධානවලට යටත්ව, මෙම ප්‍රඥප්තිය රජයේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරනු ලබන සහ පරිපාලනය කරනු ලබන මාර්ග හැර මෙහි පහත 3 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රකාශයට පත් කරන ලද සියලුම මාර්ග සඳහා අදාල විය යුතුය. ප්‍රඥප්තිය අදාල වීම.

(2) මෙම ප්‍රඥප්තිය බලාත්මක වීමත් සමග ඉහත (1) වගන්තියේ සඳහන් පරිදි මෙම ප්‍රඥප්තිය අදාල වන සියලුම මාර්ග සම්බන්ධයෙන් 1861 අංක 10 දරන මංමාවත් ආඥාපනත ද, 1902 අංක 12 දරන වතු මාර්ග ආඥාපනත ද, 1956 අංක 18 දරන වතු මාර්ග (හැරවීම) පනතද, 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරි පනත ද අනනුකූල වේ.

(3) මෙම ප්‍රඥත්තිය බලාත්මකවීමට පෙරාතුව ඉටු කර ඇති මෙහි සඳහන් කිසියම් ක්‍රියාවක් මෙම ප්‍රඥප්තියට අනුකූලව කරන ලද ක්‍රියාවක් සේ සලකනු ලැබිය යුතුය.

3. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයන් මඟින් (මෙහි මින් මතු ''අමාත්‍යවරයා'' යනුවෙන් හඳුන්වනු ලබන) ඌව පළාත් සභාවේ මාර්ග විෂයභාර අමාත්‍යවරයා විසින් මෙහි පහත 6 වැනි වගන්තියේ 6 වැනි උප වගන්තියේ සඳහන් පරිදි කිසියම් මාර්ගයක් ඌව පළාත් සභාවට අයත් මාර්ගයක් ලෙසට ප්‍රකාශයට පත් කර කරනු ලැබිය හැකිය. පළාත් මාර්ගයක් බවට ප්‍රකාශයට පත් කිරීම.

4. මෙම ප්‍රඥප්තියේ සඳහන් කාර්ය සහ කර්තව්‍ය ඉටුකර ගැනීම සඳහා ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් (මෙහි මින් මතු ''දෙපාර්තමේන්තුව'' ලෙස සඳහන් කරනු ලබන) දෙපාර්තමේන්තුවක් පිහිටුවිය යුතුය.

5. (1) ඉහත 4 වැනි වගන්තියේ සඳහන් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස මෙහි මින් මතු ''අධ්‍යක්ෂවරයා'' ලෙස සඳහන් කරනු ලබන පළාත් මාර්ග අධ්‍යක්ෂවරයෙකු පත් කළ යුතුය. ඔහුට සහාය වීම පිණිස, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ප්‍රධාන ඉංජිනේරුවරුන්, ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් හෝ සුදුසු සහ යෝග්‍ය වෙනත් නිලධාරීන් හා සේවකයින් පිරිසක් පත් කළ හැකිය. ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම.

(2) ඉහත 5 වගන්තියේ (1) උප වගන්තිය යටතේ පත්කරනු ලබන අධ්‍යක්ෂවරයා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 1 පන්තියේ නිලධාරියෙකු විය යුතුය. පළාත් මාර්ග අධ්‍යක්ෂවරයා.

(3) පළාත් මාර්ග අධ්‍යක්ෂවරයා ද, එම දෙපාර්තමේන්තුවේ සෙසු නිලධාරීන් හා සේවකයින්, අමාත්‍යවරයාගේ සහ මෙහි මින් මතු ''ලේකම් වරයා'' ලෙස හඳුන්වනු ලබන ඌව පළාත් මාර්ග සංවර්ධන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සාමාන්‍ය හා විශේෂ විධානයන්ටද, ලේකම්වරයාගේ අධීක්ෂණයට හා පරිපාලනයට යටත්ව කටයුතු කළ යුතුය.

## II වැනි කොටස

### බලතල හා කාර්යයන්

6. (1) ඌව පළාත් සභාවේ මාර්ග විෂයය භාර අමාත්‍යවරයා විසින් ප්‍රාදේශීය වුවමනා හා සැලසුම් කිරීම පිළිබඳ අවශ්‍යතා සැලකිල්ලට ගෙන, පළාත ඇතුළත කිසියම් ප්‍රදේශයක මාර්ග සංවර්ධනය කිරීම, විධිමත් කිරීම හා පාලනය කිරීම යෝග්‍ය යැයි අමාත්‍යවරයාගේ මතය වන්නේ නම් *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන නියමයක් මඟින් ඒ ප්‍රදේශය, මාර්ග විෂයභාර අමාත්‍යවරයා සතු බලතල හා කාර්යයන්.

සංවර්ධන ප්‍රදේශයක් ලෙස (මෙහි මීත් මතු ''සංවර්ධන ප්‍රදේශයක්'' යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය.

(2) සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරමින්, 6 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කරන ලද යම් නියමයක, ඒ ප්‍රදේශයේ සීමා හා මායිම් සලකුණු කොට ඒ ප්‍රදේශය වෙන් කර දැක්විය යුතුය.

(3) සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කරනු ලැබීමෙන් පසුව ලේකම්ගේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස ආණ්ඩුවේ නියෝජ්‍යායතනයක් හෝ වෙනත් යම් තැනැත්තකු විසින්, ජාතික මහා මාර්ග වල හෝ ජාතික මහා මාර්ගවල පිහිටා ඇති පාලම්වල හා තොටුපලවල් හැර කිසිදු මාර්ග සංවර්ධන වැඩ කටයුත්තක් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට සැලැස්වීම නොකළ යුතුය.

(4) මෙම ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කලින් කල ලේකම් වෙත සාමාන්‍ය හෝ විශේෂ විධාන දෙනු ලැබිය හැකි අතර, ලේකම් විසින් ඒ විධාන බලාත්මක කරනු ලැබිය යුතුය.

(5) මේ ප්‍රඥප්තියේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සහ ඒ කටයුතු යථා පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන කරුණු විමර්ශනය කිරීම අමාත්‍යවරයා සතු වගකීමක් වන්නේ ය.

(6) ඉහත සඳහන් බලතලවලට අමතරව, අමාත්‍යවරයාට පහත සඳහන් බලතල තිබිය යුතුය. අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය ලබාදීමෙන් පසුව *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයන් මගින්,

*(අ)* යම් යෝජිත මාර්ගයක්, වතු මාර්ගයක්, ඇල මාර්ගයක් හෝ ගඟක් පළාත් මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම,

*(ආ)* යම් පළාත් මාර්ගයක් භාවිතය සම්බන්ධයෙන් පාලනය විධිමත් කිරීම සඳහා සුදුසු නියෝග හා විධාන පැනවීම,

*(ඇ)* යම් පවත්නා මාර්ගයක් හෝ ඇල මාර්ගයක් නතර කරන ලෙස වෙනතකට හරවන ලෙස හෝ යොමු කරන ලෙස නියම කිරීම,

*(ඈ)* ගොඩනැගිලි ඉදිකිරීමේ සීමා ඇතුළත ගොඩනැගිලි ඉදිකිරීම වැලැක්වීම සහ පාලනය කිරීම සඳහා සුදුසු රෙගුලාසි පැනවීම,

*(ඉ)* මෙම ප්‍රඥප්තියේ සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් සඳහා නියෝග පැනවීම,

*(ඊ)* මෙම ප්‍රඥප්තියේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා යම් නිශ්චිත ප්‍රදේශයක් ප්‍රාදේශීය ඉංජිනේරු කොට්ඨාශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම.

ලේකම් සතු බලතල, කාර්යය, කර්තව්‍යය.

7. (1) 6 වැනි වගන්තියේ විධි විධානවලට යටත්ව, පළාතේ යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත, ලේකම් සතු බලතල, කාර්ය හා කර්තව්‍ය පහත සඳහන් පරිදි වන්නේ ය :–

*(අ)* අමාත්‍යවරයා විසින් ලේකම් වෙත කලින් කළ දෙනු ලැබිය හැකි විධානයන්ට යටත්ව, ඒ ප්‍රදේශයේ ඒකාබද්ධ මාර්ග සැලසුම් කිරීම, මාර්ග සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, ප්‍රාග්ධන ආයෝජන සැලසුම් සකස් කිරීම, මාර්ග සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම.

*(ආ)* අමාත්‍යවරයා විසින් ලේකම් වෙත කලින් කළ දෙනු ලැබිය හැකි විධානයන්ට යටත්ව, ඒ ප්‍රදේශ සඳහා සකස් කළ ඒකාබද්ධ මාර්ග සැලසුම්, මාර්ග සංවර්ධන වැඩසටහන්, මාර්ග සංවර්ධන ව්‍යාපෘති හා ප්‍රාග්ධන ආයෝජන සැලසුම් අනුමත කිරීම,

*(ඇ)* අමාත්‍යවරයා විසින් ලේකම් වෙත කලින් කළ දෙනු ලැබිය හැකි විධානයන්ට යටත්ව ඒ ප්‍රදේශය සඳහා සකස් කළ ඒකාබද්ධ මාර්ග සැලසුම්, මාර්ග සංවර්ධන වැඩසටහන්, මාර්ග සංවර්ධන ව්‍යාපෘති සහ ප්‍රාග්ධන ආයෝජන සැලසුම් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම අවලංගු කිරීම,

(ඇ) කිසියම් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් කරගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට ශ්‍රී ලංකාව තුළ යම් තැනැත්තෙකු, පුද්ගල මණ්ඩලයක්, සංස්ථාවක් සමඟ හවුල් ව්‍යවසායකයක් වශයෙන් ඇතුළුවීම, ඉටු කිරීම හා ක්‍රියාත්මක කිරීම,

(ඉ) යම් අනුමත මාර්ග සංවර්ධන කිරීමේ ව්‍යාපෘතියක් හෝ යෝජනා ක්‍රමයක් සම්පූර්ණ කිරීම පැහැර හැර ඇති යම් තැනැත්තකු, පුද්ගල මණ්ඩලයක් හෝ සංස්ථාවක් වෙනුවෙන් ඉදිරිපත්ව, ඒ ව්‍යාපෘතිය හෝ යෝජනා ක්‍රමය සම්පූර්ණ කිරීම සඳහා භාර ගැනීම,

(ඊ) මෙම ප්‍රඥප්තියේ සඳහන් කාර්යයන් සඳහා යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගන්නා ලද හෝ, දරන ලද චංචල හෝ නිශ්චල දේපළක් බැහැර කිරීම,

(උ) ආණ්ඩුවේ යම් නියෝජ්‍ය ආයතනයක් වෙනුවෙන් මාර්ග සංවර්ධන ව්‍යාපෘති හා සැලසුම් යෝජනා ක්‍රම ඒ නියෝජ්‍ය ආයතනයේ ඉල්ලීම පිට පිළියෙල කිරීම සහ ඒ ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රම සම්බන්ධීකරණය කිරීම හෝ ඒවා ක්‍රියාත්මක කිරීමෙහිලා සහාය වීම,

(ඌ) ආණ්ඩුවේ නියෝජ්‍ය ආයතනවල හෝ වෙනත් තැනැත්තන්ගේ ප්‍රතිලාභය සඳහා මාර්ග සැලසුම් කිරීමේ හෝ ඉදි කිරීමේ සේවා සැපයීම,

(එ) සපයනු ලබන සේවා කිසිවක් සඳහා ගාස්තු නියම කිරීම,

(ඒ) මුදලින් හෝ අන්‍යාකාරයකින් ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග හෝ සහනාධාර භාර ගෙන, ඒවා මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගැනීම.

(ඔ) මෙම ප්‍රඥප්තිය යටතේ ලේකම් සතු බලතල ක්‍රියාත්මක කිරීමට, කාර්යය ඉටු කිරීමට හා කර්තව්‍ය කිරීම සම්බන්ධ හෝ එහිලා ආනුශංගික සියලු ක්‍රියා කිරීම.

(2) මෙහි 7 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ ලේකම් විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්යය ඉටුකිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී, යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුලත මාර්ග සැලසුම් කිරීමට හෝ මාර්ග සංවර්ධනය කිරීමට අදාළව යම් වැඩසටහනක් හෝ සංවර්ධන කටයුතු කිසිවක් සකස් කරන විට හෝ ක්‍රියාත්මක කරන විට, යම් පළාත් පාලන ආයතනික ප්‍රදේශය ඒ සංවර්ධන ප්‍රදේශයට අයත් වන්නේ නම් හෝ නැතහොත් ඒ මත පැතිර තිබේනම් එකී සංවර්ධන වැඩ කටයුතුවල වැඩ සටහනට අදාළ රැස්වීමට හෝ රැස්වීම්වලට පැමිණ සහභාගි වන ලෙස අවස්ථාවෝචිත පරිදි ඒ පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයාට හෝ සභාපතිවරයාට සහ ඒ පළාත් පාලන ආයතනයේ නිලධාරියෙකුට ආරාධනා කිරීම ලේකම් විසින් කළ යුතු වන්නේ ය. එවන් ආරාධනාවක් ලද නගරාධිපතිවරයා හෝ සභාපතිවරයා හෝ නිලධාරියා එකී රැස්වීමට හෝ රැස්වීම්වලට සහභාගී විය යුතු ය.

(3) ලේකම් විසින් මේ වගන්තිය යටතේ වූ එකී බලතල කාර්ය හා කර්තව්‍ය කිසිවක් පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයාට හෝ සභාපතිවරයාට හෝ වෙනත් යම් නිලධාරියෙකුට ලිඛිතව පවරනු ලැබිය හැකිය.

බලයලත් නිලධරයන්.

8. (1) මෙම ප්‍රඥප්තියේ සඳහන් විධි විධාන පරිපාලනය කිරීම සම්බන්ධයෙන් ලේකම් වෙත පැවරී ඇති බලතල හා ලේකම් විසින් තීරණය කරන ප්‍රමාණයට පවරා දී ඇති පරිදි මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(2) මෙම ප්‍රඥප්තිය පරිපානය කිරීම සඳහා පළාත ලෙස මීන් මතු හඳුන්වනු ලබන ඌව පළාත ආවරණය වන පරිදි ප්‍රාදේශීය ඉංජිනේරු කොට්ඨාස බෙදිය යුතු අතර එකී කොට්ඨාස ආවරණය වන පරිදි ප්‍රධාන ඉංජිනේරුවරුන් හා ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් පත්කළ යුතු වන්නේ ය.

(3) මාර්ග අධ්‍යක්ෂවරයාගේ විධානයට හා පාලනයට යටත්ව, පළාත ඇතුළත මේ ප්‍රඥප්තිය පරිපාලනය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ඉංජිනේරුවරුන් හා කොට්ඨාස භාර ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් වගකිව යුතු වන්නේය.

## III වැනි කොටස

### බලතල ක්‍රියාත්මක කිරීම හා වැඩ කළමනාකරණය

ඉඩමකට ඇතුලුවීමේ බලය.

9. ප්‍රාදේශීය ඉංජිනේරුවරයා, මේ ප්‍රඥප්තිය අදාළ වන යම් වැඩ කටයුතු භාරව සිටින තාක්ෂණ නිලධාරීන්, ඔවුන් විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන සේවකයන් හා කම්කරුවන් විසින් අවශ්‍ය යම් අවස්ථාවල දී, අවශ්‍ය ආයුධ, උපකරණ වාහන හා යන්ත්‍රෝපකරණ සමඟ යම් පවත්නා හෝ අපේක්ෂිත මාර්ගයකට යාබදව හෝ අසල තිබෙන යම් ඉඩමකට දන්වා ඇතුළුවීම නිත්‍යානුකූල වන්නේ ය.

ඉඩමකින් ද්‍රව්‍ය රැගෙන යාම.

10. (1) ප්‍රාදේශීය ඉංජිනේරුවරයා තාක්ෂණ නිලධාරීන් විසින්, ඔවුන් විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන සේවකයන් හා කම්කරුවන් ද සමග සියලු යුක්ති සහගත අවස්ථාවල දී සහ අවශ්‍ය සියලු හා නිසි ආයුධ, උපකරණ, වාහන හා යන්ත්‍රෝපකරණ ද ඇතිව, යම් පවත්නා හෝ අපේක්ෂිත මාර්ගයක් ලකුණු කිරීමේ, මැනීමේ, සෑදීමේ, වැඩ කිරීමේ, විවෘත කිරීමේ, වෙනස් කිරීමේ, හැරවීමේ, අලුත්වැඩියා කිරීමේ, එළිපෙහෙලි කිරීමේ, වැඩිදියුණු කිරීමේ, ආවරණය කිරීමේ නැතහොත් ලකුණු කිරීමේලා, මැනීමේලා, සෑදිමේලා, වැඩ කිරීමේලා, විවෘත කිරීමේලා, වෙනස් කිරීමේලා, හැරවීමේලා, අලුත්වැඩියා කිරීමේලා, එළිපෙහෙලි කිරීමේලා, වැඩිදියුණු කිරීමේලා හෝ ආවරණය කිරීමේලා කරව හෝ ආකාරයකින් සහාය වීමේ කාර්යය සඳහා නැතහොත් ඒ මත ඒ හා කවර හෝ ආකාරයකින් සම්බන්ධ යම් පාලමක්, බෝක්කුවක්, වැවක්, කාණුවක්, වේල්ලක් හෝ අගලක් තැනීමේ, කැණීමේ, අලුත්වැඩියා කිරීමේ, හැරීමේ හෝ වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා ජලය, දැව, අකුලු, ගල්, බොරළු, මැටි හෝ වෙනත් කවර හෝ ද්‍රව්‍යයක් සඳහා සෝදිසි කිරීම, හෑරීම, කැපීම, කැනීම හෝ රැගෙන යාම නැතහොත් ඉහත යම් නිලධාරියෙකුගේ හෝ ඔහු යටතේ සේවයෙහි යොදවා ඇති යම් කම්කරුවෙකුගේ, තැනැත්තන්ගේ, සත්වයින්ගේ, රථවල, උපකරණවල, වාහනවල හා යන්ත්‍රෝපකරණවල ප්‍රයෝජනය සඳහා එවැනි යම් මහා මාර්ගයක් මත පිහිටා ඇති හෝ ඒ අසල පේලි ගෙවල් හෝ ගොඩනැගිලි කිසිවක් තැනීම හෝ අලුත්වැඩියා කිරීම සහ අයුතු ලෙස ඇතුලුවන්නෙකු ලෙස සළකනු නොලැබ එවැනි යම් මහා මාර්ගයකට යාබද හෝ අසල පිහිටා ඇති ඉඩමකින් ඒ කම්කරුවන්, තැනැත්තන්, සත්වයින්, රථ, උපකරණ, වාහන හා යන්ත්‍රෝපකරණ යම් තැනැත්තකුට, පුද්ගල මණ්ඩලයකට හෝ සංස්ථාවකට අයත් ඉඩමක් හරහා ගෙන යාම, නීත්‍යානුකූල වන්නේ ය :

එසේ වුව ද, ප්‍රමාණවත් ද්‍රව්‍ය ලඟ පිහිටා ඇති පාලු ඉඩම්වලින්, නැතහොත් පොදු හෝ අත්හැර ඇති භූමිවලින් පහසු ලෙස ලබාගත නොහැකි නම් මිස, එවැනි ද්‍රව්‍ය කිසිවක් සඳහා යම් මිදුලක්, නිවසකට යන මාවතක්, පිට්ටනියක්, කුඹුරක් හෝ කැලයක් ඒ කිසිවක් අයිතිකරුගේ කැමැත්ත නොමැතිව, හෑරීම, කැපීම, රැගෙන යාම නොකල යුතුය. ඉහත කී පරිදි ප්‍රමාණවත් ද්‍රව්‍ය ලබා ගත හැකි වන්නේ නම්, එසේ ඒ ද්‍රව්‍ය පහසු ලෙස ලබා ගත හැකි ස්ථානයෙන් ඒ නිලධාරියා විසින් ඒ ද්‍රව්‍ය ගනු ලැබිය හැකිය.

(2) එසේ ගනු ලබන සියලු ද්‍රව්‍ය සඳහා සහ ඒ ද්‍රව්‍ය ලබා ගැනීමේ දී හෝ රැගෙන යාමේ දී සිදු කරන ලද අලාභ සඳහා එහි අයිතිකරු වෙත සාධාරණ වන්දි මුදලක් ගෙවනු ලැබිය යුතුය. එසේම තවදුරටත්, එවැනි ද්‍රව්‍ය කිසිවක් ලබා ගන්නා ලද පතල් හෝ වලවල් කිසිවක් යම් තැනැත්තකුට හෝ සත්වයෙකුට අන්තරාදායක නොවන පරිදි, ඒ නිලධාරියා විසින් කොටු කරනු හෝ වැට බඳිනු ලැබිය යුතු ය.

තාවකාලික ගොඩනැගිලි ඉදිකිරීම.

11. (1) ප්‍රාදේශීය ඉංජිනේරුවරයා, තාක්ෂණික නිලධාරීන් සහ ඔවුන් විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන කම්කරුවන් හා සේවකයන් විසින් යම් පවත්නා හෝ අපේක්ෂිත මාර්ගයක් ලකුණු කරන විට, මනින විට, සාදන විට, වැඩ කරන විට, විවෘත කරන විට, වෙනස් කරන විට, හරවන විට, අලුත්වැඩියා කරන විට, එළිපෙහෙලි කරන විට, වැඩිදියණු කරන විට නැතහොත් ඒ මත පිහිටා ඇති හෝ ඒ හා කවර හෝ ආකාරයකින් සම්බන්ධන යම් පාලමක්, බෝක්කුවක්, වැටක්, කාණුවක්, වේල්ලක් හෝ අගලක් තනන විට, කණින විට, අලුත්වැඩියා කරන විට, එළිපෙහෙළි කරන විට හෝ වැඩිදියුණු කරන විට, එහි වැඩ කටයුතු කරනු ලබන කාලය තුළ දී ඒ නිලධරයන්ගේ, සේවකයන්ගේ, කම්කරුවන්ගේ, සතුන්ගේ, රථවල, ආයුධවල සහ ඔවුන් විසින් යොදවනු ලබන උපකරණවල හා දේපළ ප්‍රයෝජනය සඳහා ඊට යාබදව හෝ ඒ අසල පිහිටා ඇති යම් ඉඩමක, තාවකාලික ගොඩනැගිලි ඉදිකිරීම සහ යම් ඉඩම් අසල හෝ යාබදව ඔවුන් විසින් යොදවනු ලබන සියලු සතුන් යථා පරිදි දිගේලි කර හා ගාල් ගත කර තැබීම නීත්‍යානුකූල වන්නේය.

එසේ වුවද වගා කිරීමට යටත්ව ඇති කිසියම් ඉඩමක හෝ තත් කාර්යය සඳහා අසල පාළු ඉඩම් නැතහොත් පොදු හෝ අත් හරින ලද භූමි තිබෙන අවස්ථාවක, එවැනි ගොඩනැගිලි කිසිවක් ඉදිකිරීම හෝ සතුන් කිසිවක් ගාල්කර තැබීම හෝ නොකළ යුතුය.

(2) තවදුරටත් සියලු අවස්ථාවලදීම ඉඩමට කරන ලද යම් අලාභයක් වෙනුවෙන් ඉඩමේ අයිතිකරු වෙත සාධාරණ වන්දියක් ගෙවනු ලැබිය යුතුය.

තාවකාලික අතුරු පාරවල්.

12. ප්‍රාදේශීය ඉංජිනේරුවරයා තාක්ෂණික නිලධාරීන් සහ ඔවුන් විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන කම්කරුවන් විසින්, මාර්ගය තැනීමේ වැඩ කටයුතු කිසිවක් ක්‍රියාත්මක කරනු ලබන කාලය තුළ දී පාවිච්චි කිරීම පිණිස යම් සුදුසු යාබදව පිහිටි හෝ අසල පිහිටි ඉඩම් හරහා තාවකාලිකව අතුරු මාර්ගයක් තැනීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ වුවද එවැනි අතුරු මාර්ගයක්, යම් ගොඩනැගිල්ලක් පිහිටා ඇති ඉඩමක් මතුපිටින් නැතහොත් ආවෘත වත්තක් හෝ මිදුලක් මතු පිටින් තැනීම නොකළ යුතුය.

මාර්ගයට යාබද සිදු කරන කැණීම්.

13. ප්‍රාදේශීය ඉංජිනේරුවරයා, තාක්ෂණ නිලධාරීන් සහ ඔවුන් විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන කම්කරුවන් විසින් අවශ්‍ය යැයි සළකනු ලබන කවර හෝ විටක, යම් මාර්ග අයිනේ වැටවල්, බඩවැටි, අගල්, කාණු ඉවුරු හා වලවල් තැනීම හෝ සෑදීම කළ හැක. ඒ වැටවලට, බඩවැටිවලට, අගල්වලට, කාණුවලට හෝ ඉවුරුවලට යාබදව පිහිටා ඇති ඉඩම්වල අයිතිකරුවන්

හෝ පදිංචිකරුවන් විසින් ඒවා යහපත් ලෙස හා සැලකිය යුතු තරමින් අලුත්වැඩියා කර පිළිවෙලට තබා ගනු ලැබිය යුතුය. එසේ තබා ගැනීමට ඔවුන්ට මෙයින් නියම කරනු ලැබේ.

අගල් හා කාණු තැනීම හා නඩත්තු කිරීම.

14. ප්‍රාදේශීය ඉංජිනේරුවරයා, තාක්ෂණ නිලධාරීන් සහ ඔවුන් විසින් සේවයෙහි කියුක්ත කරනු ලබන කම්කරුවන්ට, සියලු අගල්, කාණු හෝ දිය ඇළි සෑදීමට, පිරිසිදු කිරීමට හා විවෘතව තැබීමටද, යම් මාර්ගයකට හෝ ඇලකට යාබදව හෝ අසල පිහිටා ඇති යම් ඉඩමක හා ඉඩමක් හරහා යම් මාර්ගයක හෝ ඇලක ආරක්ෂාව සඳහා හෝ යම් මාර්ගයක් හෝ ඇලක් වැඩි දියුණු කිරීම, තැනීම හා නඩත්තු කිරීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන යම් උමං හෝ පාලම් තැනීමට හා පිහිටුවීමට ද බලය ඇත්තේ ය.

ගස් කැපීම හා ඉවත් කිරීම.

15. ප්‍රාදේශීය ඉංජිනේරුවරයා, තාක්ෂණ නිලධාරීන් සහ ඔවුන් විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන කම්කරුවන් විසින් යම් මාර්ගයක හෝ යම් මාර්ගයක් උඩින් වැවී ඇති හෝ එහි යම් අවහිරයක් හෝ අන්තරායක් සිදු කරන සියලු ගස්, පඳුරු හා ලැහැබ සහ ගස්වල කොළ හෝ අතු හෝ මුල් කැපීම, ඉවත් කිරීම හා යම් යාබදව හෝ අසල පිහිටා ඇති ඉඩමකට දැමීම සහ ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි පරිදි යම් තැනැත්තන්, සතුන් හා උපකරණ සහිතව යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුලුවීම සහ ඒ ගස්, පඳුරු, ලැහැබ, කොළ, අතු, මුල් කැපීම, පෑහීම හෝ ඉවත් කිරීම සඳහා අවශ්‍ය සියලු දේ එහිදී කරගෙන යාම නීත්‍යානුකූල වන්නේ ය.

මාර්ග ඉදිකිරීමේ ද්‍රව්‍ය තබා යාම.

16. ප්‍රාදේශීය ඉංජිනේරුවරයා, තාක්ෂණ නිලධාරීන් සහ ඔවුන් විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන කම්කරුවන් හා ගිවිසුම්වලට ඇතුළත්ව ඇති කොන්ත්‍රාත්කරුවන් විසින්, ඒ අලුත්වැඩියා කටයුතු කිරීම පහසු කිරීම හෝ මෑතක දී අලුත්වැඩියා කරන ලද මාර්ගයට අලාභ සිදුවීම වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි යම් මාර්ගයක් මත ගල්, බොරළු සහ වෙනත් යම් ඉදිකිරීමේ ද්‍රව්‍ය, වාහන හෝ යන්ත්‍රෝපකරණ රැස්කිරීම, තැබීම හා ගොඩගැසීම සහ ඒ මාර්ගය අලුත්වැඩියා වෙමින් පවත්නා කාලය තුළ සහ අලුත්වැඩියා කටයුතු ආරම්භ වීමට පෙර සහ අලුත්වැඩියා කටයුතු අවසන් වීමෙන් පසු යම් කාලයක් සඳහා තැබීමට ඉඩ හැරීම කළ හැකිය. ඒ මාර්ගයෙහි ගමන් කරන තැනැත්තන්ට හෝ ධාවනය වන වාහනවලට අන්තරායක් හෝ හානියක් සිදුවීම වැළැක්වීම පිණිස නිලධරයන් විසින් නිසි පූර්වෝපායන් ගනු ලැබිය යුතුය.

ඉඩම්වල ඉදිකිරීමේ ද්‍රව්‍ය තබා යාම.

17. මාර්ග තැනීමේ වැඩ කටයුතු කිසිවක් කරනු ලබන අතරතුර පාවිච්චි කිරීමට අවශ්‍ය විය හැකි, පස් හෝ වෙනත් ද්‍රව්‍ය යම් යාබද හෝ අසල පිහිටා ඇති ඉඩමක, ප්‍රාදේශීය ඉංජිනේරුවරයා, තාක්ෂණ නිලධාරීන් සහ ඔවුන් විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන කම්කරුවන් විසින් තැබීම නීත්‍යානුකූල වන්නේ ය.

යම් ඉඩමක අපද්‍රව්‍ය රැස් කිරීම.

18. යම් පවත්නා හෝ අපේක්ෂිත මාර්ගයක් ලකුණු කරන, මනින, සාදන, වැඩ කරන, විවෘත කරන, වෙනස් කරන, හරවන, අලුත්වැඩියා කරන. එලිපෙහෙලි කරන, වැඩිදියුණු කරන අතරතුර නැතහොත් ඒ මත පිහිටා ඇති හෝ ඒ හා කවර හෝ ආකාරයකින් සම්බන්ධ යම් පාලමක්, වැවක්, කාණුවක්, වේල්ලක්, අගලක් තනන, කනින, අලුත්වැඩියා කරන එලිපෙහෙලි කරන හෝ අලුත්වැඩියා කරන අතරතුර එවැනි යම් නිලධරයකු හෝ ඔවුන් විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් කම්කරුවකු විසින් එවැනි යම් වැඩබිමකින් ඉවත් කිරීමට අවශ්‍ය සියලු පස් සහ අනෙකුත් අපද්‍රව්‍ය ඊට යාබද හෝ අසල පිහිටා ඇති යම් ඉඩමක රැස් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

එසේ වුවද මෙම වගන්තිය යටතේ ඉවත් කරනු ලබන පස් හා අනෙකුත් අපද්‍රව්‍ය යාබද හෝ අසල පිහිටි ඉඩමකට රැස් කරනු ලැබුවේ නම් සාධාරණ කාලසීමාවක් ඇතුළතදී ඒ ස්ථානයෙන් බැහැර කර යථා පරිදි පවත්වාගෙන යාමට හැකිවන සේ සකස් කර දීමේ වගකීම අදාළ සේවයේ නියුක්ත වූවන්ගේ වගකීම වන්නේ ය.

පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම හා පාවිච්චි කිරීම.

19. වෙනත් යම් පනතක් යටතේ ආණ්ඩුව විසින් පනවා ඇති හෝ කලින්කල පනවනු ලබන රීතිවලට හා නියෝගවලට යටත්ව, මාර්ග තැනීමේ වැඩ කටයුතු සඳහා අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීමට හා සැපයුම්කරුවන්ගෙන් වැඩ බිම් වෙත ප්‍රවාහනය කිරීමට ප්‍රාදේශීය ඉංජිනේරුවරයාට හෝ ඔහු විසින් බලය දී ඇති යම් නිලධරයෙකුට බලය ඇත්තේ ය. පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීමේ හා ප්‍රවාහනය කිරීමේ කාර්යය සඳහා අදාළ බලධාරීන්ගෙන් ලබාගත් අවසර පත්‍රයක් ඔවුන් සතුව තිබිය යුතු අතර, ඒ පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා ආරක්ෂක කාමර හෝ මැදිරි ද ඔවුන් සතු විය යුතුය.

අලාභ සඳහා වන්දි ගෙවීම.

20. (1) මේ ප්‍රඥප්තිය අදාළ වන වැඩ කටයුතු භාරව සිටින නිලධරයන් වෙත යම් ප්‍රඥප්තියෙන් පැවරී ඇති බලතල හා අධිකාර කිසිවක් ක්‍රියාත්මක කිරීම හේතු කොට ගෙන යම් පාඩුවක් හෝ අලාභයක් දැරීමට සිදුවන සෑම තැනැත්තෙකුට ඒ සඳහා වන්දි ලැබීමට හිමිකම් ලැබිය යුතුය. එසේ වුවද, ඒ අලාභය සිදු වී යයි කියනු ලබන්නේ යම් ක්‍රියාවක්, කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් ද ඒ ක්‍රියාව, කාරණය හෝ දෙය සිදුවීමෙන් මාස තුනක් ඉකුත් වීමට පෙර කවර හෝ අවස්ථාවක ඒ සඳහා ප්‍රාදේශීය ඉංජිනේරුවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඉහත කී කාලය ඇතුළත ඒ ඉල්ලීම ඉදිරිපත් කිරීම පැහැර හරිනු ලැබුවහොත්, උද්දේශිත හානිය සඳහා වන්දි ලබා ගැනීම පිණිස වූ ඒ ඉල්ලීමට ඉඩ දෙනු නොලැබිය යුතුය. ඉන්පසු වන්දි අයකර ගැනීමට ඇති අයිතිය ඉල්ලුම්කරුට අහිමි වන්නේ ය.

(2) ඉහත සඳහන් නියමිත කාලය ඇතුළත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති විටක, වන්දි ප්‍රමාණය පිළිබඳව එකඟතාවයකට එළඹිය නොහැකි නම්. ඒ වන්දි ප්‍රමාණය, අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන එක් බේරුම්කරුවකු හා වන්දි ඉල්ලා සිටින තැනැත්තා විසින් නම් කරනු ලබන තවත් බේරුම්කරුවකු විසින් තීරණය කරනු ලැබිය හැකිය. බේරුම්කරුවන් දෙදෙනාටම එකඟතාවයකට එළඹීමට නොහැකිවන්නේ නම්, ලේකම් විසින් තීරකයකු පත් කරනු ලැබිය යුතු අතර, පාර්ශ්වකරුවන් විසින් එකඟ වෙනු ලබන කොන්දේසි අනුව බේරුම්කරුවන් හෝ තීරක විසින් දෙනු ලබන තීරණය අවසානාත්මක වන්නේ ය.

## IV වැනි කොටස

### මාර්ග වැඩ විෂයෙහි බාධාවන් සීමා කිරීම් හා පාලනය

වැඩ කටයුතුවලට බාධා කිරීම.

21. ප්‍රාදේශීය ඉංජිනේරුවරයාගේ විධානය හා බලය යටතේ කාර්යයන් හි යෙදී සිටින යම් නිලධරයෙකුට හෝ කම්කරුවකුට බාධා කරන, අවහිර කරන, තර්ජනය කරන හෝ පහර දෙන යම් තැනැත්තෙකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයෙකු විසින් වරදකරු කරනු ලබද්දී අපරාධයේ බරපතල භාවය හා වරදේ ස්වභාවය අනුව රුපියල් පන්දහසකට නොඅඩු දසදහසකට නොවැඩි දඩයකට හෝ මාස 6කට නොඅඩු වසරකට නොවැඩි සිර දඬුවමකට හෝ එකී දෙආකාරයෙන්ම හෝ දඬුවමකට යටත් විය යුතුය.

වෙනත් ආයතනවල වැඩ පිළිබඳ ප්‍රමිති නියම කිරීම හා අධීක්ෂණය.

22. (1) පළාත් සභාවට අයත් යම් පළාත් මාර්ගයක් තැනීම, නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම, යම් සංස්ථාවකට, සමාගමකට, වතු අධිකාරියකට, ප්‍රාදේශීය මණ්ඩලයකට, ආණ්ඩුව විසින් ඒ ආයතනවලට හෝ තැනැත්තන්ට වෙන් කරන ලද ප්‍රතිපාදන යොදා ගනිමින් ඒ සංස්ථාව, සමාගම, වතු අධිකාරිය, ප්‍රාදේශීය මණ්ඩලයක් විසින් කරනු ලබන විට, ඒ වැඩ කටයුතු මාර්ග අධ්‍යක්ෂගේ අධීක්ෂණය යටතේ කරගෙන යාමෙහි ලා ඒ ආයතන හෝ තැනැත්තන් විසින් අනුගමනය කළයුතු අවම ප්‍රමිති, මාර්ග අධ්‍යක්ෂ විසින් නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) එම මාර්ගය මැනීමේ, ලකුණු කිරීමේ හෝ පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා මාර්ග අධ්‍යක්ෂ හෝ ප්‍රධාන ඉංජිනේරු හෝ ප්‍රාදේශීය ඉංජිනේරුවරයා හෝ මාර්ග අධ්‍යක්ෂ විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින්, කම්කරුවන්, ආයුධ හා උපකරණ ද සමඟ යම් අසල ඉඩමකට හෝ වැඩ බිමකට ඇතුළුවීම නීත්‍යානුකූල වන්නේ ය.

මාර්ග භාවිතය විෂයෙහි සීමා කිරීම්.

23. පළාත් මාර්ග අධ්‍යක්ෂ විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින්, ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින්, යම් මාර්ගයක්, ඉඩමක් හෝ ඊට යාබද ගොඩනැගිල්ලක් භාවිතා කිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් කාරණා කිසිවක් පිළිබඳව සීමා කිරීම් නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය :—

(1) පළාත් මාර්ගයකින් යම් ප්‍රවේශවීමේ පාරක් තැනීම, පිහිටුවීම හෝ සකස් කිරීම ;
(2) ප්‍රවේශවීමේ මාර්ග ගණන වැඩිවන යම් ආකාරයකින් යම් ඉඩමක් වෙන් කර දීම ;
(3) යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම, යම් ගොඩනැගිල්ලක්, සාප්පුවක් හෝ වාණිජ මධ්‍යස්ථානයක් වශයෙන් පාවිච්චි කිරීම, යම් මාර්ගයක මධ්‍යයේ සිට යම් නිශ්චිත දුර ප්‍රමාණයක් ඇතුළත නාම පුවරු තැනීම හෝ ඉදිකිරීම ;
(4) යම් මාර්ගයක යම් නිශ්චිත කොටසක් හරහා ඇවිද යාම හෝ ගවයින් රැගෙන යාම ;
(5) මාර්ගයෙහි යම් නිශ්චිත ප්‍රවාහන පිළිවෙලක් භාවිතා කිරීම ;
(6) යම් මාර්ගයක, කිසියම් යන්ත්‍රෝපකරණ ධාවනය කිරීම ;
(7) යම් මාර්ගයක හෝ යම් දිශාවක් ඔස්සේ වාහන ගමනාගමනය සීමා කර ඇති විටක මාර්ග පාවිච්චි කිරීම.

ඉහත සඳහන් කාරණා සම්බන්ධයෙන් නියම කර ඇති සීමා කිරීම් කිසිවක් කඩකරන යම් තැනැත්තකු, වරදකට වරදකරු විය යුතු අතර, එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයෙකු විසින් වරදකරු කිරීමෙන් පසු රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

ප්‍රවේශවීමේ මාර්ග ලබා දීම.

24. (1) ප්‍රාදේශීය ඉංජිනේරුවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව, යම් මාර්ගයකට හෝ යම් මාර්ගයක සිට කවර හෝ ස්වභාවයෙන් යුත් ප්‍රවේශ මාර්ගයක් තැනීමට හෝ සෑදීමට, මේ ප්‍රඥප්තිය යටතේ කිසිම තැනැත්තෙකුට අවසර නොතිබිය යුතුය. යම් තැනැත්තකුට මාර්ගයක සිට යම් ප්‍රවේශ මාර්ගයක පහසුතාව වුවමනා වන්නේ නම්, ඔහු විසින් ඒ සඳහා ඉහත සඳහන් නිලධරයාගෙන් අවසර ලබා ගත යුතුය. ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් අදාළ ස්ථානය පරීක්ෂා කර අදාළ පාර්ශ්වයට සුදුසු උපදෙස් දෙනු ලැබිය යුතුය.

(2) අවසර දෙන ලද ඒ ප්‍රවේශ මාර්ගය, කොන්ක්‍රීට් නාලිකාකාර බෝක්කුවක්, පාලමක්, වේදිකාවක් හෝ යම් ආරක්කුවක් විය හැකිය. තනන ලද බෝක්කුවේ විවෘත හරස් අතට වූ මාර්ගයේ ප්‍රමාණය සහ ප්‍රවේශ මාර්ගයේ පළල ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් නියම කරනු ලැබිය යුතුය.

(3) තැනීම සඳහා අවසර ලැබුණු තැනැත්තා විසින්, මාර්ගයේ පිහිටා ඇති පැති කාණුවට අවහිර සිදු වී නොමැති බවට හෝ ජලය ගලායාමට කවර හෝ ආකාරයකින් බාධා සිදු වී නොමැති බවට, වගබලා ගත යුතුය. ප්‍රවේශ මාර්ගය තැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් වඩදියට, තෙල් හෝ වැසි ජලය එක්කාසු වීමට හෝ ඒකරාශී වීමට ඉඩදෙනු නොලැබිය යුතු අතර, ප්‍රවේශ මාර්ගය ඇතුළත කිසිදු ගල්වලට, බොරළුවලට, පස්වලට හෝ වෙනත් අපද්‍රව්‍යවලට එක්කාසු වීමට හෝ ඒකරාශී වීමට ද ඉඩ දෙනු නොලැබිය යුතුය.

(4) යම් ප්‍රවේශ මාර්ගයක් තනනු ලැබීමේ දී මාර්ගයට සිදුකරන ලද අලාභ සඳහා ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් මුදලක් අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය. යම් ප්‍රවේශ මාර්ගයක් තැනීමේ මුළු වියදම, අදාළ පාර්ශ්වය විසින් දරනු ලැබිය යුතුය.

(5) මේ නියමයන් කිසිවක් කඩ කරන යම් තැනැත්තෙකු හෝ ආයතනයක්, මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කිරීමෙන් පසු රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

උපයුක්ත සේවා සඳහා අවසර ලබා දීම.

25. (1) (උපයුක්ත සේවාවන්ට අදාළ යම් නීතිවල විධිවිධානවලට යටත්ව) මාර්ගය යටින් හෝ මතුපිටින් හෝ අසල මහජන සේවා සැපයීමේ ක්‍රමයක් ස්ථාපනය කිරීමේ කාර්යය සඳහා (මෙහි මින්මතු "උපයුක්ත සේවා සපයන්නන්" ලෙස හඳුන්වනු ලබන) යම් තැනැත්තෙකු, සංස්ථාවක්, සමාගමක්, ප්‍රාදේශීය අධිකාරියක් හෝ දෙපාර්තමේන්තුවක් සමඟ ප්‍රාදේශීය ඉංජිනේරුවරයාට ගිවිසුම්වලට ඇතුළත්වීමට හැකියාවක් ඇත්තේ ය.

(2) යම් මාර්ගයක යටින්, මතුපිටින්, හෝ අසලින් එවැනි යම් මහජන සේවාවක් ස්ථාපනය කිරීම සඳහා ඉල්ලුම් කර ඇති විටක, මාර්ගය හෑරීමේ ගැඹුර හා පළල, තැනීමේ ස්ථානය, තැනීමේ වැඩ කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වන දිනය, තැනීමේ කාලය හා භාවිතා කරනු ලබන යන්ත්‍රෝපකරණ පිළිබඳව සම්පූර්ණ විස්තර, උපයුක්ත සේවා සපයන්නන් විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(3) විස්තර කර ඇති පරිදි ඒ යෝජනාව ලැබුණු විට ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින්, උපයුක්ත සේවා සපයන්නන් විසින් ඒ තැනීමේ කටයුතු කර ගෙන යාමෙහි ලා මාර්ගය නැවත තැනීම සඳහා නැතහොත් මාර්ගයට සිදු වූ අලාභ අලුත්වැඩියා කිරීමෙහි ලා දරන වියදම් තක්සේරු කරනු ලැබිය යුතුය. වැඩ කටයුතු ආරම්භ කිරීමට පෙරාතුව, ඒ තක්සේරු කරන ලද මුදල් ප්‍රමාණය උපයුක්ත සේවා සපයන්නන් විසින් ගෙවනු ලැබිය යුතු අතර, එවිට ප්‍රාදේශීය ඉංජිනේරුවරයා ගිවිසුමකට ඇතුළත්ව ඒ තැනීමේ වැඩ කටයුතු කර ගෙන යාමට ලිඛිත අවසරය ලබා දිය යුතුය.

(4) උපයුක්ත සේවා සපයන්නන් විසින් මාර්ගයට බාධා කිරීම් හා අවහිර කිරීම් සිදු කරනු ලබන අවස්ථාවක, ප්‍රාදේශීය ඉංජිනේරුවරයා සෑහීමට පත්වන ආකාරයකින් ඒ බාධා කිරීම් ඉවත් කරන ලෙස, ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් උපයුක්ත සේවාවන් සපයන්නන් වෙත දැනුම්දීමක් කරනු ලැබූ අවස්ථාවක උපයුක්ත සේවා සපයන්නන් විසින් එම නියෝගය පැහැර හරිනු ලැබුවහොත් හෝ ඒ සඳහා වෙනත් උපයුක්ත සේවා සපයන්නෙකු සොයා ගැනීමට නොහැකි වුවහොත් ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් ඒ වැඩ කටයුතු සිදුකර, ඒ වැඩ කටයුතු සඳහා දරන ලද වියදම පූර්ව උපයුක්ත සේවා සපයන්නා වෙතින් අයකර ගැනීම, නීත්‍යානුකූල වන්නේය.

(5) යෝජනාවේ සඳහන් කර ඇති පරිදි ගැඹුර, පළල, ස්ථානය හා පරිශ්‍රය පිළිබඳ සීමා, උපයුක්ත සේවා සපයන්නන් විසින් අනුගමනය කරනු ලැබිය යුතුය. එහි ලා යම් වෙනස් කිරීමක් අවශ්‍ය යැයි සලකනු ලබන්නේ නම්, ඒ බව උපයුක්ත සේවා සපයන්නන් විසින් වහාම ප්‍රාදේශීය ඉංජිනේරුවරයා වෙත දැනුම් දිය යුතුය. ඒ පිළිබඳව සුදුසු තීරණයක් ගනු ලැබ, යම් අතිරේක ගෙවීමක් කළයුතු වන්නේ නම් ඒ බව ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතුය.

(6) ප්‍රාදේශීය ඉංජිනේරුවරයාගේ ලිඛිත අවසරය ලබා නොගෙන උපයුක්ත සේවා සපයන්නන් විසින්, ගැඹුර, පළල, ස්ථානය හෝ පරිශ්‍රය සම්බන්ධයෙන් වෙනස් කිරීම් සිදු නොකළ යුතුය.

(7) උපයුක්ත සේවා සපයන්නන් විසින් මාර්ගයෙහි වැඩ කටයුතු කිසිවක් කිරීමේ දී ඒ මහජන උපයුක්ත සේවා පද්ධතියට සිදු කරන ලද යම් අලාභයක් සඳහා ප්‍රාදේශීය ඉංජිනේරුවරයා හෝ ඔහුගේ නිලධාරීන් හෝ කම්කරුවන් වගකිව යුතු නොවන්නේ ය.

26. (1) පළාත් සභාවට අයත් මාර්ග සම්බන්ධයෙන් ගොඩනැගිලි තැනීමේ සීමා, බර සීමා පහත සඳහන් පරිදි වන්නේය:— ගොඩනැගිලි තැනීමේ සීමා හා බර සීමා.

(i) *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන නියෝගයක් මඟින් "සී" පංතියේ මාර්ගයක් ලෙස අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද මාර්ගයක් සම්බන්ධයෙන් වන විට, මාර්ග මධ්‍ය රේඛාවේ සිට මාර්ගය දෙපසටම මීටර් 07 (හත) බැගින් ගොඩනැගිලි තැනීමේ සීමාව වන අතර, ද්‍රව්‍ය හෝ මිනිසුන්, සතුන් හා ද්‍රව්‍ය ඇතුළුව පටවන ලද සම්පූර්ණ බර සමඟ වාහනයේ බර මෙට්‍රික් ටොන් 12කට නොවැඩි වන සේ මාර්ගයෙන් මාර්ගයට වෙන වෙනම අදාළ වන සේ අධ්‍යක්ෂවරයා විසින් තීරණය කර ඔහු විසින් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතුය.

(ii) *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන නියෝගයක් මඟින් "ඩී" පංතියේ මාර්ගයක් ලෙස අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන මාර්ගයක් සම්බන්ධයෙන් වන විට, මාර්ග මධ්‍ය රේඛාවේ සිට මාර්ගය දෙපසටම මීටර් 07 ක් බැගින් ගොඩනැගිලි තැනීමේ සීමාව වන අතර, පටවන ලද සම්පූර්ණ බර සමඟ වාහනයේ බර මෙට්‍රික් ටොන් 10කට නොවැඩි වන සේ මාර්ගයෙන් මාර්ගයට වෙන වෙනම අදාළ වන සේ අධ්‍යක්ෂවරයා විසින් තීරණය කර ඔහු විසින් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතුය.

(iii) *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන නියෝගයක් මඟින් "ඊ" පංතියේ මාර්ගයක් ලෙස අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන මාර්ගයක් සම්බන්ධයෙන් වන විට, මාර්ගය මධ්‍ය රේඛාවේ සිට මාර්ගය දෙපසටම මීටර් 05 බැගින් ගොඩනැගිලි තැනීමේ සීමාව වන අතර, පටවන ලද සම්පූර්ණ බර සමඟ වාහනයේ බර මෙට්‍රික් ටොන් 8 කට නොවැඩි වන සේ මාර්ගයෙන් මාර්ගයට වෙන වෙනම අදාළ වන සේ අධ්‍යක්ෂවරයා විසින් තීරණය කර ඔහු විසින් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතුය.

(2) ගොඩනැගිලි තැනීමේ නියමිත සීමාව ඇතුළත, යම් තැනැත්තෙකු විසින් යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටු මඟක් ඉදිකිරීම, නීත්‍යානුකූල නොවන්නේ ය. හානියට පත් හෝ දිරාපත් වූ සෙවිලි තහඩු මාරු කිරීම, කැඩුණු බිත්ති අලුත්වැඩියා කිරීම සහ සායම් ආලේප කිරීම හා එවැනි වෙනත් වැඩ කටයුතු හැර පවත්නා ව්‍යුහයන් විෂයෙහි කරනු ලබන වෙනස්කිරීම් කිසිවක් ද නීත්‍යානුකූල නොවන්නේ ය.

(3) ගොඩනැගිලි සීමාව තුළ තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිල්ලක්, තාප්පයක්, ගේට්ටුවක්, වැටක්, දැන්වීම් පුවරුවක් හෝ වෙන යම් කුමන හෝ ඉදිකිරීමක් සඳහා නිර්වන්දි ගිවිසුමක් මත කිසියම් පාර්ශවයකට අවසරය ලබා දීමට අධ්‍යක්ෂවරයාට හැකිය. එවැනි නිර්වන්දි ගිවිසුමක් මත ඉදිකරනු ලබන කිසියම් ඉදි කිරීමක් අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියෙකු විසින් ලිඛිතව දැනුම් දෙනු ලබන අවස්ථාවක දී කඩා ඉවත්කර ගැනීමට එකී පාර්ශවය කටයුතු කළ යුතු අතර එවැනි අවස්ථාවක දී සිදුවන අලාභහානි සඳහා කිසිදු වන්දියක් නොගෙවිය යුතුය.

(4) අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය ලබාගැනීමෙන් පසුව *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන නියෝගයක් මඟින් මේ සීමා වැඩි කිරීමට හෝ අඩු කිරීමට අමාත්‍යවරයාට බලය ඇත්තේ ය. මේ සීමා, යම් මාර්ගයකට හෝ එහි යම් කොටසකට හෝ අදාළ වන පරිදි නියම කරනු ලැබිය හැකිය.

(5) මේ සීමාව දෙපැත්තෙහිම පිහිටා ඇති ඉඩම් ප්‍රදේශය "ගොඩනැගිලි තැනීමේ සීමා" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

(6) මෙම ප්‍රඥප්තිය යටතට ගත හැකි මාර්ග සම්බන්ධයෙන් වාහන සම්බන්ධයෙන් වන බර සීමාවන් හා පරිමාව එනම් වාහනයේ දිග, පළල හා උස අමාත්‍යවරයා විසින් කලින්කල *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියෝග මඟින් ප්‍රකාශයට පත් කළ යුතුය.

(7) අමාත්‍යවරයා විසින් ඉහත (5) උපවගන්තිය යටතේ නියම කරන ලද බර සීමාවන් හා පරිමාව එනම් වාහනයේ දිග, පළල හා උස ප්‍රාදේශීය ඉංජිනේරු විසින් අදාළ මාර්ගයෙහි තැනින් තැන පහසුවෙන් දැකගත හැකිවන පරිදි විධිමත් පරිදි ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම නීත්‍යානුකූල වන්නේ ය.

(8) *(අ)* නියමිත යම් මාර්ගයක ඒ ගොඩනැගිලි තැනීමේ සීමා ඇතුළත පතල් කැණීම හා පතල් කැණීමේ කාර්යය සඳහා පතල් ලිං කැණීම වරදක් වන්නේ ය.

*(ආ)* එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයෙකු වරදකරු කරනු ලබද්දී අපරාධයේ බරපතලභාවය හා වරදේ ස්වභාවය අනුව රුපියල් පන්දහසේ සිට විසිපන්දහස දක්වා වූ දඩයකට හෝ මාස 06 කට නොඅඩු වසරකට නොවැඩි සිර දඬුවමකට හෝ එකී දෙආකාරයෙන්ම හෝ දඬුවමකට යටත් විය යුතුය. එසේ වරදකරු කරනු ලැබූ තැනැත්තෙකු වෙතින් අදාළ මාර්ගය සඳහා කැණීම් තුලින් සිදු වී ඇති හානිය ප්‍රාදේශීය ඉංජිනේරු විසින් ගණන් බලන ආකාරයට අයකර ගැනීමට අධ්‍යක්ෂ වෙත බලය ඇත්තේ ය.

(9) ගොඩනැගිලි තැනීම් සීමා ඇතුළත වූ නීති විරෝධී ඉදිකිරීම් ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් ඉවත් කිරීමට සලස්වා ඒ කාර්යයෙහිලා දරන ලද වියදම් අදාළ තැනැත්තන්ගෙන් අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

එසේ වුව ද, මේ ප්‍රඥප්තිය බලාත්මක වීමට පෙරාතුව, අලුත්වැඩියා කිරීම සඳහා බලපත්‍රයක් අවශ්‍ය වූ යම් ගොඩනැගිල්ලකට, මායිම් තාප්පයකට හෝ දොරටු මඟකට කරන ලද අලුත්වැඩියා කිරීම් නොවන හෝ මේ ප්‍රඥප්තිය බලාත්මක වූ දිනයෙහි පැවති යම් ගොඩනැගිල්ලකට, මායිම් තාප්පයකට, දොරටු මඟකට හෝ වෙනත් යම් ව්‍යුහයකට හෝ යම් ළිඳකට, පොකුණකට හෝ පතල් ළිඳකට සිදු කරමින් පවතින යම් අලුත්වැඩියා කටයුතු කෙරෙහි හෝ මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන කිසිවක් අදාළ නොවිය යුතුය. එසේම මෙම උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන කිසිවක් බස් නැවතුම් පොළවල්, බිල්පත්‍ර පුවරු, දැන්වීම් පුවරු ආදී ව්‍යුහයන් කෙරෙහි අදාළ නොවිය යුතුය.

යෝජිත ගොඩනැගිලි සීමා ඇතුළත ඉදිකිරීම් විෂයෙහි පාලනය.

27. (1) අලුත් මාර්ගයක් නිර්මාණය කර ඇති හා ඉදිරි දිනයක දී එහි තැනීමේ වැඩ කටයුතු ආරම්භ කිරීමට පියවර ගෙන ඇති අවස්ථාවක, යම් සිතියමක හෝ පිඹුරක නිරූපණය කර ඇති පරිදි නැතහොත් විස්තර කර ඇති පරිදි, ප්‍රාදේශීය ඉංජිනේරු විසින් තීරණය කරන ලද රේඛාවේ සිට මාර්ගයෙහි දෙපැත්තෙහි ම ඉඩම් ප්‍රදේශය, අමාත්‍යවරයා විසින් යෝජිත මාර්ගයේ ගොඩනැගිලි තැනීමේ සීමා වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.

(2) ගොඩනැගිලි ඉදිකිරීමට අවසර ලබා දීමේ වගකීම පැවරී ඇති බලධාරීන් විසින්, අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලැබූ විට, එවැනි ප්‍රකාශයක් මත ප්‍රකාශයට පත් කරන ලද අවශේෂිතය ඇතුළත යම් අලුත් ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා අවසරය ප්‍රදානය කරනු නොලැබිය යුතුය. ගොඩනැගිලි තැනීමේ සීමා ඒ මාර්ගවලට සමාන ලෙස අදාළ විය යුතුය.

ඉඩම් අයුතු ලෙස ඈඳා ගැනීම.

28. (1) යම් තැනැත්තෙකු විසින් ගොඩනැගිලි සීමාවලට යාබදව පිහිටි යම් මාර්ගයක් නැතහොත් පළාත් සභාවට අයත් යම් ඉඩමක් අයුතු ලෙස ඈඳා ගැනීම නීත්‍යානුකූල නොවන්නේ ය.

(2) ඊනියා අයුතු ලෙස ඈඳා ගැනීම් විමර්ශනය කිරීමේ කාර්යය සඳහා මැනීම් කිරීම පිණිස මේ ප්‍රඥප්තිය යටතේ බලය, ප්‍රාදේශීය ඉංජිනේරුවරයා සහ ඔහුගේ බලය යටතේ වැඩ කරන නිලධරයන් සතු විය යුතුය.

(3) ප්‍රාදේශීය ඉංජිනේරුවරයා හෝ ඔහුගේ බලය යටතේ වැඩ කරන නිලධාරීන් විසින් ඉහත 28 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියෙහි සඳහන් එවැනි අයුතු ලෙස ඈඳා ගන්නන් ඉවත් කිරීම හෝ නිදහස් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

නීති විරෝධී ඉදිකිරීම්, බාධා කිරීම් හා අයුතු ලෙස ඈඳා ගැනීම් ඉවත් කිරීම.

29. යම් පළාත් මාර්ගයක බාධා කිරීම් හෝ අයුතු ලෙස ඈඳා ගැනීම් සිදු කරන යම් තැනැත්තකුට ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින්, ඒ බාධා කිරීම් හෝ අයුතු ලෙස ඈඳා ගැනීම් වහාම නැතහොත් නිශ්චිත දිනයක හෝ එදිනට පෙර ඉවත් කරන ලෙස හෝ නතර කරන ලෙස, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් නියම කිරීම, නීත්‍යානුකූල වන්නේ ය. ඒ නියමය ලබන එවැනි යම් තැනැත්තකු විසින් සාධාරණ කාලයක් ඇතුළත ඒ නියමය අනුව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ නොසලකා හරිනු ලැබුවහොත්, නැතහොත් ඒ නියමය දෙනු ලැබිය යුතු නිසි තැනැත්තා සම්බන්ධයෙන් යම් සැකයක් ඇත්නම්, ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් එවැනි යම් බාධා කිරීමක් හෝ අයුතු ලෙස ඈඳා ගැනීමක් වහාම ඉවත් කිරීමට හෝ නතර කිරීමට සැලැස්වීම නීත්‍යානුකූල වන්නේ ය. තව ද, ඒ කාර්යය සඳහා ප්‍රාදේශීය ඉංජිනේරුවරයා නැතහොත් අවශ්‍ය විටක ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් නැතැත්තකු විසින් ඒ ඉවත් කිරීම හෝ නතර කිරීම සඳහා අවශ්‍ය යම් උපකරණ හා දේ සමඟ යම් නිවාසයකට, වත්තකට, කොටුවකට හෝ වෙනත් පරිශ්‍රයකට ඇතුලුවීම නීත්‍යානුකූල වන්නේ ය. තව ද, ප්‍රාදේශීය ඉංජිනේරු හෝ ඔහු විසින් බලය පවරන ලද අය විසින් මෙම වගන්තිය යටතේ සද්භාවයෙන් දරන ලද වියදම්

ප්‍රාදේශීය ඉංජිනේරු විසින් කරනු ලබන දැනුම් දීමකින් පසු බාධා කිරීම් හෝ අයුතු ලෙස ඇඳා ගැනීම් සිදු කළ තැනැත්තා විසින් ගෙවිය යුතු වන්නේ ය. එකී තැනැත්තා විසින් අදාළ ගෙවීම් සිදු කරනු නොලැබුවේ නම් ඒ බව අධිකරණ විෂයෙහි බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ප්‍රාදේශීය ඉංජිනේරු විසින් දිවුරුම් ප්‍රකාශයක් සහිතව වාර්තා කළ යුතු අතර, එසේ වාර්තා කිරීමේ දී එම වාර්තාවේ සඳහන් මුදල ද ඒ සඳහා නිසි ලෙස දරන ලදැයි අධිකරණයට පෙනී යන ගෙවීම් ගාස්තුවක් ද සහිතව අධිකරණය විසින් දඩ මුදලක් ලෙස අය කර පළාත් සභා පොදු අරමුදලට බැර කළ යුතුය. එසේ වුව ද, ඒ පරිශ්‍රයේ හිමිකම කෙරෙහි බලපාන සියලු ඔප්පු, ලේඛන හා සාධන පත්‍ර යථා පරිදි ඉදිරිපත් කිරීමෙන් පසුව, යම් ඉවත් කිරීමක් සිදු කරනු ලැබුවහොත් එයින් සිදු වූ සියලු පාඩු හා හානි සම්බන්ධයෙන් අලාභ ගෙවීමට, ප්‍රාදේශීය ඉංජිනේරුවරයා යටත් විය යුතුය. එහෙත් ඒ පරිශ්‍රයෙහි අයිතිකරු යැයි කියා සිටින පාර්ශවකරු ඒ ඔප්පු, ලේඛන හා සාධන පත්‍ර ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කළහොත් හෝ පැහැර හැරියහොත්, නැතහොත් ඒවා ඉදිරිපත් කරනු නොලැබුවහොත් ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් ඒ ගොඩනැගිල්ල කොටු කිරීම හෝ අයුතු ලෙස ඇඳා ගැනීම ඉවත් කරනු ලැබීමට සැලැස්විය යුතුය. එවිට, ඒ පරිශ්‍රය එහි අයිතිකරු යැයි කියා සිටින පාර්ශවකරුගේ යැයි තීරණය කරනු ලැබුවහොත්, එයින් සිදු වූ යම් පාඩුවක් හෝ හානියක් සම්බන්ධයෙන් අලාභ ගෙවීමට ප්‍රාදේශීය ඉංජිනේරුවරයා වගකිව යුතු නොවන්නේ ය.

## V කොටස

### මාර්ගවලට සිදු කරන හානි, වැරදි සහ දණ්ඩන

මාර්ගවලට සිදු කරන හානි.

30. මේ ප්‍රඥප්තියට අදාළ පහත සඳහන් කවර හෝ ක්‍රියාවක් වරදක් වන අතර, එම ක්‍රියාවට අදාළ වරදක් සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක දී මහෙස්ත්‍රාත්වරයා විසින් වරදකරු කිරීමෙන් පසු රුපියල් පන්දහසේ සිට විසිපන්දහස දක්වා වූ දඩයකට හෝ මාස 6 කට නොඅඩු වසරකට නොවැඩි සිර දඬුවමකට හෝ එකී දෙආකාරයෙන්ම යුත් දඬුවමකට වරදකරු කරනු ලැබූ තැනැත්තා යටත් කළ යුත්තේ ය.

(1) යම් මාර්ගයක් හෝ යම් මාර්ගයක කොටසක්, සැතපුම් කණුවක්/කිලෝමීටර් කණුවක්, පහන් කණු, වේලි, පාලම්, තාප්ප, වාහන ගමනාගමනය පාලනය කිරීමේ උපකරණ, වැටවල් හෝ යම් මාර්ගයකට අයත් වෙනත් යම් ඉදිකිරීමක් හෝ අයිතමයන් විනාශ කිරීම ;

(2) යම් මාර්ගයක හෝ මාර්ගය දෙපැත්තෙහි ප්‍රාදේශීය ඉංජිනේරුවරයාගේ බලය යටතේ වවා ඇති යම් ගසක්, තණ පිඩලි හෝ ඇති කර ඇති යම් වැටක් ඉවත් කිරීම හෝ විනාශ කිරීම ;

(3) මාර්ගයක් පාවිච්චි කිරීම වැළැක්වීමේ කාර්යය සඳහා හෝ මාර්ගයක් අලුත්වැඩියා කිරීමේ දී මාර්ගය පාවිච්චි කරන තැනැත්තන්ට අන්තරායක් හෝ හානි සිදුවීම වැළැක්වීමේ කාර්යය සඳහා තබා ඇති යම් වැටක්, මුරපොලු හෝ වෙනත් යම් දෙයක් ඉවත් කිරීම ;

(4) පටවන විට හෝ බාන විට හෝ නොඑසේ නම් යම් මාර්ගයක දැව, දැව කඳන්, වැලි, ගල් හෝ වෙනත් යම් ද්‍රව්‍ය ඇහිරීම, එක්කාසු කිරීම, තැනීම හෝ ගොඩගැසීම ;

(5) යම් මාර්ගයකින් ගල්, වැලි, බොරළු, පස්, තණ පිඩලි හෝ වෙනත් ද්‍රව්‍ය කිසිවක් රැස් කිරීම, එක්කාසු කිරීම හෝ රැගෙන යාම ;

(6) යම් මාර්ගයකට හානි සිදු වන යම් ආකාරයකින් කවර හෝ ස්වභාවයක සතුන් දක්කාගෙන යාම, එළවීම ;

(7) ජලය ගලායාම සඳහා තනන ලද යම් පැති කාණුවක් ඔස්සේ වැසි ජලය ගලා යාමට හෝ යම් බෝක්කුවකින් හෝ වෙනත් ඉදිකිරීමකින් ජලය පිට වී යාමට බාධා කිරීම ;

(8) මාර්ගයට අලාභ සිදුවන යම් ආකාරයකින්, දැව, දැව කඳන්, ගල්, යකඩ හෝ වෙනත් යම් ද්‍රව්‍ය කිසිවක් ඇදගෙන යාමෙන් හෝ ට්‍රේලර් වාහනයකින් ගෙන යාමෙන් ඒ මාර්ගය මත වැරෙන් ඇදීම ;

(9) යම් මාර්ගයක් මත සුළං පුරවන ලද රෝද නොමැතිව, යන්ත්‍රෝපකරණ ධාවනය කිරීම ;

(10) යම් මාර්ගයකට අයත් යම් වේල්ලක්, අගලක්, කාණුවක් හෝ වලක් නැතහොත් යම් මාර්ගයක් මත හෝ

හරහා හෝ යම් මාර්ගයක් මතුපිට සාදන ලද ජල මාර්ගයක් කඩා දැමීම නැතහොත් ඒ කිසිවකට හානි සිදු කිරීම ;

(11) කවර හෝ කාර්යයක් සඳහා යම් මාර්ගයක් හරහා, ඔස්සේ හෝ යටින් පතල් කැණීම, හෑරීම හෝ වෙනත් යම් කටයුත්තක් කිරීම ;

(12) යම් මාර්ගයක ඇති පැති කාණුවේ පිට කෙළවර උඩින් නෙරායන පරිදි යම් නිවාසයකට එකතු කිරීම් සිදු කිරීම හෝ ඇඳීම, හෝ යම් නිවාසයක් ඉදිරිපිට බඩු පැටවීමේ හෝ බඩු බෑමේ කාර්යය සඳහා යම් මාර්ගයක පැති කාණුවට හානි සිදු කිරීමෙන් හෝ පිරවීමෙන් හෝ ඊට යම් අවහිරයක් සිදු කිරීමෙන්, යම් මාර්ගයක යම් කොටසක් හෝ එහි පැති කාණුවක් උඩින් කවර හෝ ආකාරයක තාවකාලික ආධාරක මගින් හෝ අන්‍යාකාරයකින් ආවරණය කිරීම හෝ වැසීම ;

(13) යම් බෝක්කුවක් හෝ යම් ඉදිකිරීමක ඇති කුහරයක් අර්ධ වශයෙන් හෝ සම්පූර්ණ ලෙස වසා දැමීම හෝ එයට අවහිර කිරීම හෝ පස් පිරවීම මගින් හෝ වෙනත් මාර්ගයකින් පවත්නා මට්ටමකට වැඩි මට්ටමකට, යම් පාලමකට, බෝක්කුවකට හෝ යම් මාර්ගයකට යාබද යම් ඉඩමක් පිරවීම හෝ යම් තැනීමක් ඉදිකිරීම නැතහොත් නිදහසේ ජලය ගලා යාම වැළැක්වීම, ඊට බාධා කිරීම හෝ එය නතර කිරීම පිණිස වෙනත් යම් ක්‍රියාවක් සිදු කිරීම ;

(14) යම් මාර්ගයක මාර්ග තලයට පහතින් පිහිටි ඉඩමක් හෝ වේල්ලක් මාර්ගයට කුමන හෝ ආකාරයෙන් හෝ හානිවන ආකාරයට එළිපෙහෙළි කිරීම, වේලි කැපීම, කැණීම හෝ වෙනයම් ඕනෑම ආකාරයකින් කටයුතු කිරීම ;

(15) යම් මාර්ගයකට හෝ යම් මාර්ගයක පැති කාණුවකට හෝ බෝක්කුවකට හෝ පාලමකට, ගල්, පස්, වැලි, කුණු රොඩු, ගල් කුඩු, දහයියා, ලී කුඩු හෝ වෙනයම් අපද්‍රව්‍යක් හෝ අප ජලය හෝ අපවිත්‍ර වූ ජලය දැමීම හෝ හැරවීම හෝ ගලා ඒමට සැලැස්වීම හෝ එසේ සිදුවීමට ඉඩ හැරීම.

මාර්ගවලට සිදු කරන ලද හානි සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් සතු කාර්යය.

31. (1) යම් මාර්ගයකට යම් හානිකර ක්‍රියාවක් සිදු කරන යම් තැනැත්තකුට ඒ ක්‍රියාව වහාම නතර කරන ලෙස, අවමකරණය කරන ලෙස හෝ වෙනස් කරන ලෙස දැනුම් දීමට, ප්‍රාදේශීය ඉංජිනේරුවරයාට බලය ඇත්තේ ය.

(2) යම් මාර්ගයකට සිදු කර ඇති යම් හානියක් හෝ අවහිරයක් නතර කිරීම හෝ වැළැක්වීම සඳහා, ප්‍රාදේශීය ඉංජිනේරුවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු විසින් ස්වකීය කම්කරුවන්, ආයුධ, උපකරණ හා යන්ත්‍රෝපකරණ ද සමඟ යම් ඉඩමකට ඇතුලුවීම, නීත්‍යානුකූල වන්නේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒ ඉඩමට හෝ දේපළට සිදු කරන ලද යම් අලාභයක් සඳහා වන්දි කිසිවක් ගෙවනු නොලැබිය යුතුය.

(3) යම් මාර්ගයක් අලුත්වැඩියා කිරීමේ, සකස් කිරීමේ, වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා නැතහොත් යම් අන්තරාදායක අවස්ථාවක දී අවශ්‍ය යැයි ප්‍රාදේශීය ඉංජිනේරුවරයා සලකන යම් කාලයක් සඳහා යම් මාර්ගයක හෝ එහි යම් කොටසක කවර හෝ මාර්ගයක සතකු පිට යාම හෝ සතකු හෝ කරත්තයක් ඇදගෙන යාම හෝ වාහන පදවාගෙන යාම, සියලු තැනැත්තන්ට තහනම් කිරීමට, ප්‍රාදේශීය ඉංජිනේරුවරයාට බලය හා අවසරය ඇත්තේ ය.

මාර්ගවලට සිදු කරනු ලබන පීඩා.

32. පහත සඳහන් කවර හෝ ක්‍රියාකාරකමක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන අතර, එවැනි වරදක් සම්බන්ධව මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොඅඩු රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොඅඩු වසර දෙකකට නොවැඩි සිරගත කිරීමකට හෝ එම දෙආකාරයෙන්ම යුත් දඬුවමකට යටත් විය යුතුය.

(1) යම් ප්‍රසිද්ධ මාර්ගයක් ඔස්සේ ධාවනය කිරීමේ යම් වාහනයක්, කරත්තයක්, බෝට්ටුවක්, පහුරක් හෝ වෙනත් ප්‍රවාහනයක් ඕනෑකමින්ම වැළැක්වීම හෝ බාධා කිරීම ;

(2) පහසුවෙන් යාත්‍රා කිරීම කෙරෙහි හානිකර හෝ බාධා වන පරිදි යම් මාර්ගයක, ඇලක හෝ ගඟක යම් වැටක් හෝ වෙනත් යම් අවහිරයක් තැනීම හෝ ඒ අවහිරය දිගටම තැබීම ;

(3) යම් ආපදාවක් හෝ පැහැර හැරීමක් සිදු වූ විටක මිස හෝ එවැනි ආපදාවක දී එය ඉවත් කිරීමට අවශ්‍ය කාලයට වැඩි කාලයක් යම් කරත්තයක්, රථයක්, මෝටර් වාහනයක්, කන්ටේනරයක් හෝ යන්ත්‍රෝපකරණ මාර්ගයක තබා යාම හෝ තබා යාමට අවසර දීම.

(4) හිරු බැස යාම හා හිරු උදාවීම අතර කාලය තුළ, එළියක් නොමැතිව, යන්ත්‍රෝපකරණ කිසිවක්, කැඩුණු වාහනයක් හෝ වෙනත් යම් වාහනයක් මාර්ගයක තබා යාම ;

(5) යම් මාර්ගයක, ගඟක හෝ ඇලක නැතහොත් ඒ මාර්ගයෙහි, ගඟෙහි හෝ ඇලෙහි ගල්, ගඩොල්, දැව, තෙල්, වීදුරු හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් තබා යාම හෝ ඒවා ඒ කිසිවකට විසි කිරීම.

(6) යම් මාර්ගයක් ඔස්සේ හෝ හරහා ටියුබ්, නල හෝ වෙනත් දෙයක් ඇසිරීම නැතහොත් කොහු ලණු, ලණු හෝ කම්බි බැඳ තැබීම.

(7) විකිණීමේ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා යම් පැදුරු, රෙදි, පැළලි, ධජ හෝ වෙනත් යම් ද්‍රව්‍ය යම් මාර්ගයක් මත හෝ මාර්ගයක එල්ලීම නැතහොත් වැල් හෝ කොහු ලණු ගැටගසා යම් මාර්ගයක් දිගට හෝ හරහා රෙදි වේලීම සඳහා එල්ලීම.

(8) යම් මාර්ගයකට හෝ මාර්ගයක් තුළට ගවයින්, මී හරකුන්, එළුවන්, බැටළුවන්, අශ්වයින්, බල්ලන් හෝ කවර හෝ වර්ගයකට අයත් වෙනත් සතුන් මුදා හැරීම.

(9) ඉහත (8) වැන උපවගන්තියේ සඳහන් සතුන්ට යම් මාර්ගයකට හෝ මාර්ගයක් තුළට යාමට හැකි වනු පිණිස ගැට ගැසීම හෝ දිගේලි කිරීම.

(10) යම් මාර්ගයක රථ, මෝටර් වාහන, ගවයින් හෝ වෙනත් සතුන් හෝ වෙනත් දේ සේදීම ;

(11) යම් මාර්ගයක දෙපස ඇති කාණු හා බෝක්කු, තම ඉඩමට හෝ දේපළට මායිම් වන සේ පැමිණි විට දී එම කාණු සහ බෝක්කු අවහිර කිරීම හෝ වසා දැමීම.

(12) යම් මාර්ගයක මාර්ග තලය මත හෝ මාර්ග උරහිසෙහි හෝ මාර්ග රක්ෂිතය තුල හෝ පැති කාණුවක් මත හෝ දැන්වීම් පුවරු හෝ නාම පුවරු හෝ වෙනයම් ස්ථිර හෝ තාවකාලික ඉදිකිරීමක් ඉදිකිරීම.

මාර්ගවලට සිදු කරන ලද පීඩා සම්බන්ධයෙන් අදාල නිලධාරීන් සතු කාර්යය.

33. (1) ප්‍රාදේශීය ඉංජිනේරුවරයා, ඔහුගේ නිලධාරීන්, කම්කරුවන් විසින් අවශ්‍ය ආයුධ හා උපකරණ ද සමග මාර්ගය මත හෝ මාර්ගය තුළට සිදු කර ඇති යම් අවහිරයක් වැළැක්වීම, ඉවත් කිරීම, කඩා බිඳ දැමීම හෝ විනාශ කිරීම පිණිස යම් ඉඩමකට හෝ දේපලකට ඇතුලුවීම, නීත්‍යානුකූල වන්නේ ය. එහිලා දරන ලද වියදම්, අදාල තැනැත්තාගෙන් අය කර ගැනීම ද නීත්‍යානුකූල වන්නේ ය.

(2) ප්‍රාදේශීය ඉංජිනේරුවරයා ඔහුගේ නිලධාරීන්, කම්කරුවන් විසින්, අවශ්‍ය ආයුධ හා උපකරණ ද සමග මාර්ගය මත හෝ මාර්ගය තුළට සිදු කර ඇති යම් අවහිරයක් වැළැක්වීම සහි එහිලා දරන ලද වියදම් අදාල තැනැත්තන්ගෙන් අය කර ගැනීම පිණිස අවශ්‍ය හා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) ප්‍රාදේශීය ඉංජිනේරුවරයා හෝ ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් ඒ සම්බන්ධයෙන් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ඉහත 32 වැන වගන්තියේ (8) හා (9) වැන උපවගන්තිවල සඳහන් යම් සතෙකු තහනමට ගෙන අල්ලා ඒ සතාගේ භාරකාරත්වය ළඟම පිහිටා ඇති පොලිස් ස්ථානය වෙත භාර දීම නීත්‍යානුකූල වන්නේ ය. ප්‍රාදේශීය ඉංජිනේරුවරයා හෝ ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ඉහත කී පරිදි තහනමට ගන්නා ලද ඒ සතුන් සම්බන්ධයෙන් වන්දි සඳහා යම් හිමිකම් පෑමකට, අයිතිකරු හිමිකම් නොලබන්නේ ය.

(4) එවැනි යම් සතෙකු පටවනු හෝ බානු ලබන තෙක්, ඒ සතා යම් මාර්ගයක බැඳ තැබීමට හෝ දිගේලි කිරීමට, පොලීසියට හෝ වෙනත් යම් බලධරයකුට හෝ ආණ්ඩුවේ නිලධරයකුට හෝ අවසරය ඇත්තේ ය. එසේ වුව ද එසේ බැඳ තැබීම හෝ දිගේලි කිරීම, මාර්ගය පාවිච්චි කරන්නන්ට යම් අපහසුතාවයක් සිදු නොවන ආකාරයකින් කළ යුතුය.

දේපල අත් කර ගැනීම.

34. (1) යම් ඉඩමක් හෝ ඒ ඉඩමේ යම් සම්බන්ධතාවයක් අවස්ථාවෝචිත පරිදි මාර්ගයක් ඉදිකිරීමට, පුළුල් කිරීමට, හැරවීමට, වෙනස් කිරීමට හෝ රක්ෂිතයක් ලෙස පවත්වා ගැනීමට හෝ පාලමක්, බෝක්කුවක්, කෝසුවක්, බැම්මක් හෝ වෙනත් යම් ඉදිකිරීමක් සඳහා හෝ වැටක්, කාණුවක්, වේල්ලක් තැනීමට හෝ අගලක් කැපීමට හෝ වෙනත් මොනයම් හෝ මාර්ග සංවර්ධන කටයුත්තක් සඳහා අවශ්‍ය වන්නේ නම් එකී ඉඩම හෝ එම ඉඩමේ සම්බන්ධතාවය (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ ඌව පළාත් සභාව වෙනුවෙන් රජය විසින් අත්කරගනු ලැබිය හැකිය.

(2) මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා පළාත ඇතුළත වූ යම් රජයේ ඉඩමක් අවශ්‍ය වන අවස්ථාවක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ II වැනි පරිශිෂ්ඨයේ 1-1:2 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

වන්දි ගෙවීම.

35. ඉඩම් අත්කර ගැනීම හෝ වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදලේ ප්‍රමාණය ගණනය කිරීම සඳහා පහත සඳහන් විධිවිධාන අදාල විය යුතුය.

(1) අලුත් මාර්ග තැනීමේ කාර්යය සඳහා අත්කර ගනු ලැබූ ඉඩමේ හා දේපල සම්බන්ධයෙන් (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව වන්දි ගෙවනු ලැබිය යුතුය ;

(2) යම් පවත්නා ඉඩමක ගොඩනැගිලි තැනීමේ සීමාව ඇතුළත පිහිටා ඇති යම් ගොඩනැගිල්ලක් හෝ වෙනත් යම් ඉදිකිරීමක් සම්බන්ධයෙන්, වන්දි ගෙවීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක ජාතික ප්‍රතිපත්තියේ සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන වන්දි ගෙවනු ලැබිය යුතුය.

නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට සහාය වීම

36. (1) පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරයා, ග්‍රාමසේවා නිලධාරීහු, තාක්ෂණ නිලධාරීහු, සාම නිලධාරීහු, ආදී නීතිය ක්‍රියාත්මක කරන සියලු නිලධාරීන් විසින් ඔවුන්ගේ ඒ ඒ බල ප්‍රදේශ ඇතුළත මාර්ගවල කරන ලද වැඩකටයුතු සහ මේ ප්‍රඥප්තියෙහි සඳහන් අපරාධ හා වැරදි සිදු කිරීම වැළැක්වීම සම්බන්ධයෙන්, ඔවුන්ගේ ඒ ඒ බල ප්‍රදේශ ඇතුළත, පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත ස්වකීය සහාය දැක්වීම, ඒ සියලු නිලධාරීන්ගේ වගකීම වන්නේ ය.

(2) තමන්ගේම අදහස අනුව නැතහොත් වෙනත් තැනැත්තන් විසින් සපයන ලද තොරතුරු මත එවැනි යම් වරදක් හෝ අපරාධයක් දැන සිටින ඒ සෑම නිලධරයකු විසින් ම මේ ප්‍රඥප්තිය යටතේ යථා පරිදි අධ්‍යක්ෂ වෙත ඒ පිළිබඳව පැමිණිල්ල කරනු ලැබිය යුතුය.

නිලධාරීන්ගේ විෂමාචාරය.

37. මේ ප්‍රඥප්තිය යටතේ යම් ක්‍රියාවක් කිරීමේ මුවාවෙන් යම් ප්‍රචණ්ඩත්වයක්, විෂමාචාරයක්, හිරිහැර කිරීමක් කරන හෝ නුවමනා හා පීඩාකාරී අනර්ථයක් කරන සෑම බලයලත් නිලධරයකු හෝ තැනැත්තකු විසින්ම, මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතුය.

වැරදි හා දණ්ඩන.

38. මේ ප්‍රඥප්තිය යටතේ සඳහන් විධිවිධානයන් මගින් වරදකට අදාල දඬුවම් නිශ්චිතව නියම කර නොමැති අවස්ථාවක දී ප්‍රඥප්තියේ නියෝගයක යම් විධිවිධානයක් හෝ දෙන ලද යම් නියමයක් කඩකරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකුම, මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු අතර, එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොඅඩු රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොඅඩු වසර දෙකකට නොවැඩි සිරගත කිරීමකට හෝ ඒ දෙආකාරයටම යුත් දඬුවමකට යටත් විය යුතුය.

වියදම් අයකර ගැනීම.

39. (1) මේ ප්‍රඥප්තිය යටතේ අයකර ගනු ලැබිය හැකි වියදම් යන්නෙන්, පළාත් සභාව විසින් හෝ වෙනුවෙන් සැබවින්ම දරන ලද වියදම්වල ප්‍රමාණය සහ ඒ ප්‍රමාණයට සියයට විසිපහක (25%) අතිරේක මුදලක් එකතු කිරීමෙන් ලැබෙන මුළු මුදල අදහස් වේ. එනම් සැබෑ වියදමට සියයට විසිපහක (25%) අතිරේක මුදලක් එකතු කිරීමෙන්, වියදම ගණනය කරනු ලැබිය යුතුය.

(2) අයවීමට ඇති මුදල් ප්‍රමාණය දක්වමින් බිල් පත්‍රයක් ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් පිළියෙල කොට සහතික කර, ඒ බිල් පත්‍රය වගකිව යුතු තැනැත්තාට නියමිත දිනයේ දී හෝ එදිනට පෙර සම්පූර්ණයෙන් ගෙවන ලෙස නියම කරමින්, ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් ඒ වගකිව යුතු තැනැත්තාට භාර දෙනු ලැබිය යුතුය.

(3) 39 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ නියමය අනුව ඒ තැනැත්තා විසින් ක්‍රියා කරනු නොලබන අවස්ථාවක සැබෑ වියදමට සියයට විසිපහක (25%) අතිරේක මුදලක් එකතු කර, සහතික කොට ඒ කාරණය මෙම ප්‍රඥප්තියේ 26(7) ආ අනු වගන්තිය ප්‍රකාරව අධිකරණය වෙත යොමු කරනු ලැබිය යුතුය.

40. මෙම ප්‍රඥප්තිය අදාල වන මාර්ගයක්, මාර්ගයක යම් කොටසක් විෂයයෙහි හෝ සම්බන්ධයෙන් අයිතිය, සන්තකය හෝ භාවිතය පිළිබඳ තනි අයිතිවාසිකම්වලට කිසිම තැනැත්තකු හිමිකම් නොලබන්නේ ය.

41. යම් තැනැත්තෙක් විසින් මෙහි 26 වැනි වගන්තියේ සඳහන් ගොඩනැගිලි සීමාව හා මාර්ග හිමිකම් සීමාව අතර යම් ඉදිකිරීමක්, තාප්පයක් හෝ කුමන ආකාරයේ හෝ වැටක් ඉදිකරන්නේ නම් ඊට ප්‍රාදේශීය ඉංජිනේරුගේ අවසරය ලබාගත යුතු අතර, මාර්ගය පළල් කිරීම හෝ සංවර්ධනය කිරීමේ දී එකී ඉදිකරන ලද තාප්පය හෝ කුමන ආකාරයේ හෝ වැට කිසිදු වන්දියක් ඉල්ලීමකින් තොරව ස්ව කැමැත්තෙන් තමන්ගේ වියදමින් ඉවත්කර ගන්නා බවටත්, එසේ ඉවත් කරනොගතහොත් මාර්ග සංවර්ධන

දෙපාර්තමේන්තුව මගින් ඉවත් කිරීමට බාධාවක් හෝ අවහිරයක් නොකරන බවටත්, එසේ ඉවත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් දරන ලද වියදම් දෙපාර්තමේන්තු ගාස්තු සමඟ ප්‍රාදේශීය ඉංජිනේරු වෙත, එසේ ගෙවන ලෙස දන්වා දින හතක් ඇතුලත ගෙවන බවටත් ප්‍රාදේශීය ඉංජිනේරු සමග ගිවිසුමකට එළඹිය යුතුය.

42. මේ ප්‍රඥප්තිය යටතේ දීමට නියමිත සියලු දැන්වීම් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් දෙනු ලැබිය යුතුය. යම් තැනැත්තකු අමතනු ලැබූ යම් දැන්වීමක් හෝ බලපත්‍රයක් හෝ නියෝගයක් හෝ විධානයක් අදාල ඒ තැනැත්තාට පෞද්ගලිකවම භාරදීමෙන් හෝ ඔහු පදිංචි ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ඇලවීමෙන් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට එහි කාර්යාලයට භාරදීමෙන් හෝ එම තැනැත්තාට හෝ මණ්ඩලයට හෝ සංස්ථාවට ලියාපදිංචි තැපෑලෙන් යැවීම විධිමත් භාර දීමක් ලෙස සැලකිය යුතුය.

43. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨයන් අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

44. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස —

අර්ථ නිරූපනය.

"පළාත" යන්නෙන්, බදුල්ල හා මොණරාගල යන පරිපාලන දිස්ත්‍රික්ක දෙක ඇතුලත් වූ ඌව පළාත අදහස් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ඌව පළාතේ පළාත් සභාව අදහස් වේ ;

"පළාත් අමාත්‍යවරයා" යන්නෙන්, මාර්ග සංවර්ධන විෂය භාර ඌව පළාත් සභාවේ අමාත්‍යවරයා අදහස් වේ ;

"ලේකම්වරයා" යන්නෙන්, ඌව පළාත් මාර්ග සංවර්ධන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ ;

"මාර්ග" යන යෙදුමෙහි, මංමාවත්, ආඥාපනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

"මාර්ග සංවර්ධනය කිරීම" යන යෙදුමෙන්, අලුත් මාර්ග තැනීම සහ අලුත් හා පවත්නා මාර්ග නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම අදහස් වේ ;

"ඇළ" යන යෙදුමෙන්, යම් පොදු ඇළක් අදහස් වන අතර, එයට අයත් පැති, ඇදගෙන යාමේ මාර්ග, ඉවුරු, කාණු හා අගල් ද සමග ඉවුරෙන් ඉවුරට වූ ජල මාර්ගයේ මුළු ප්‍රමාණය ඊට ඇතුළත් වේ ;

"පළාත් මාර්ග අධ්‍යක්ෂ" යන යෙදුමෙන්, ඌව පළාතේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා අදහස් වේ ;

"ප්‍රධාන ඉංජිනේරු" යන යෙදුමෙන්, ඌව පළාතේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියලුම ප්‍රධාන ඉංජිනේරුවන් හෝ ප්‍රධාන විධායක ඉංජිනේරුවන් අදහස් වේ ;

"ප්‍රාදේශීය ඉංජිනේරු" යන යෙදුමෙන් ඌව පළාතේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියලුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් හෝ ප්‍රාදේශීය විධායක ඉංජිනේරුවන් හෝ කොට්ඨාස භාර විධායක ඉංජිනේරුවන් අදහස් වේ ;

"ජාතික මහා මාර්ග" යන යෙදුමෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහා මාර්ග විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ, ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, ජාතික මහා මාර්ග අදහස් වේ ;

"මහජන කාර්යය" යන්නට, මේ ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ මහජන කාර්යයක් වශයෙන් සලකනු ලබන කාර්යයක් ඇතුළත් වේ ;

"උපයුක්ත සේවා" යන යෙදුමෙන් දුරකථන රැහැන් වල දැමීම සඳහා කාණු හෑරීම, ජලනල එලීම සඳහා කාණු හෑරීම, විදුලි කණු, දුරකථන කණු සිටුවීම ආදී ඕනෑම ක්‍රියාවක් අදහස් වේ.

06-487

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.